**මීරිගම ප්‍රාදේශීය සභාව - 2020**

**----------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

1.1. **තත්ත්වාගණනය කළ මතය**

------------------------------

මීරිගම ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මීරිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-------------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතා අනුව ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබූ පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. 1.3 (අ) , 1.3 (ආ) (ii) , 1.3 (ආ) (iii)

1.6. **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---------------------------------------------------------------------------

1.6.1. **ගිණුම්කරණ අඩුපාඩු**

--------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබුණු රු.139,537,708 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන වලින් වර්ෂයට අදාල වටිනාකම වන රු.13,953,771 ක් පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් වන පැවරුම් ගිණුමට මාරු නොකිරීම හේතුවෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂයේ ලැබුනු ප්‍රාග්ධන ප්‍රදාන වලට අදාලව වාර්ෂිකව හඳුනාගනු ලබන ක්ෂය ප්‍රමාණය 2021 වර්ෂයේ සිට පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් වන පැවරුම් ගිණුමට මාරුකර ආදායම් ප්‍රකාශනයේ සටහන් කරනු ලැබිය යුතු බව කාරුණිකව දන්වමි. | ප්‍රාග්ධන ප්‍රධාන ප්‍රමිත පරිදි ගිණුම් තැබීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ 2020 අගෝස්තු 27 දිනැති LGD/09/2019/01 චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් හා වගකීම් නිවැරදි ප්‍රභේදය යටතේ වර්ගීකරණය කළයුතු බව අවධාරණය කර තිබුණද වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී පහත අඩුපාඩු පැවතුණි. | | |

| | | | |
|---|---|---|---|
| (i) | මෝටර් රථ හා කරත්ත ප්‍රති හඳුනාගැනීමේදී මෝටර් වාහන, කරත්ත ලෙස වත්කම් කාණ්ඩ දෙකකට වර්ගීකරණය කර මෝටර් වාහන 4% ක්ද කරත්ත 20% ක්ද ලෙස වෙන වෙනම ක්ෂය කළයුතු වුවද, එසේ කටයුතු නොකර රු.42,091,910 ක් වූ මෝටර් වාහන හා කරත්ත 4% බැගින් රු.1,683,676 ක් ක්ෂය කර තිබුණි. | 2020 වර්ෂය සඳහා වන ක්ෂය හා අදාල වත්කම් වටිනාකම් ජ' නල් සටහන් මාර්ගයෙන් 2021 වර්ෂයේදී ගැලපීම් කර නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් නිසි පරිදි වර්ගීකරණය කර නිවැරදි ක්ෂය අනුපාත යටතේ ක්ෂය කළයුතු වේ. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුලදී මංමාවත්, බෝක්කු හා පාලම් ලෙස රු.159,482,630 ක් හා වෙනත් යටිතල පහසුකම් ලෙස රු.23,665,106 ක් ප්‍රාග්ධනිතකර තිබුණි. සභාවේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව මංමාවත්, බෝක්කු හා පාලම් සඳහා 10% ක ක්ෂය අනුපාතයක් දක්වා තිබුණද වෙනත් යටිතල පහසුකම් සඳහා ක්ෂය අනුපාතයක් දක්වා නොතිබුණු අතර චක්‍රලේඛය ප්‍රකාරවද එවැනි වත්කම් කාණ්ඩයක් හඳුන්වාදී නොතිබුණි. | 2021 වර්ෂයේ සිට වෙනත් යටිතල පහසුකම් ක්ෂය කරන විට, නිශ්චිත ක්ෂය අනුපාතයක් හඳුනාගෙන ඒ අනුව ක්ෂය කිරීමට කටයුතු කරමි. | නිවැරදි වත්කම් කාණ්ඩ යටතේ ගිණුම්ගත කළයුතු වේ. |
| (ඇ) | පරිගණක මෘදුකාංග පද්ධතීන් දෙක ප්‍රාග්ධනිත කිරීමේදී රු.295,000 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ජ'නල් සටහන් මාර්ගයෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් නිවැරදි වටිනාකම් හඳුනාගෙන ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ඈ) | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන - 2020 වෙනුවෙන් මීරිගම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ජ'නල් සටහන් මාර්ගයෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ලැබියයුතු ආදායම් සියල්ල හඳුනාගැනීමට කටයුතු කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | පරිපාලන වියදම් ලෙස ලැබියයුතු රු.512,542 ක් ආදායම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම හේතුවෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් පෙන්වා තිබුණි. | | |
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට රු.15,360 ක් වූ මුද්දර ශේෂය ගිණුම්ගතකර නොතිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කරමි. | අදාල ශේෂය ගිණුම්ගත කළයුතු වේ. |

1.6.2. **නොසැසඳූ පාලන ගිණුම්**

-------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | ---------------------------- | ----------- |
| මූල්‍ය ප්‍රකාශන අනුව එකතු වටිනාකම රු.297,207,257 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාල ශේෂයන් හා ඊට අදාල උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.34,338,588 ක වෙනසක් විය. | උපලේඛනවල ශේෂයන් නිවැරදි වේ. වර්තමානයේ ලේඛණ නිවැරදිව පවත්වා ගෙන යන අතර, ඒවායින් ලබාගත් උපලේඛන නිවැරදි වුවත්, ගිණුම්වල වර්ෂ ගණනක සිට පැවත එන ශේෂයන් සාවද්‍ය වේ. එම ගිණුම් හා උපලේඛණ අතර වෙනස්කම් වලට හේතු සොයාගත නොහැකි වීම නිසා ගිණුම්වල වටිනාකම් නිවැරදි කිරීමට නොහැකිව ඇති බව දන්වමි. | ගිණුම් නිවැරදිව සකස්කිරීමට කටයුතු කළයුතු වේ. |

1.6.3. **විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොමැතිවීම**

--------------------------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | ------------------------- | ------------ |
| රු.1,785,841ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලිවලට අදාලව විගණනය සඳහා පැවරුම් නියෝග සහ ඔප්පු ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂය අවසන් වීමට පෙර අවශ්‍ය කටයුතු කරමි. | ලේඛන ගත සාක්ෂි පවත්වා ගෙන යායුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු.65,540,331 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.33,023,119 ක් විය.

## 2.2. ආදායම් පරිපාලනය

### 2.2.1. වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1946 අංක 30 දරනබදු හා තක්සේරුකරන පනතේ වගන්ති අංක 20 ප්‍රකාරව වරිපනම් බදු තක්සේරුව වර්ෂ 05 කට වරක් තක්සේරු දෙපාර්තමේන්තුව ලවා තක්සේරු කරවා ගතයුතු වුවත් ප්‍රාදේශීය සභාව විසින් වරිපනම් බදු තක්සේරුව අවසන්වරට සිදුකර තිබුණේ 2009 වර්ෂයේදී වන අතර 2020 දෙසැම්බර් 31 දිනට රු.7,103,817 ක් වූ වරිපනම් හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකිරීමටත්, වරිපනම් බදු තක්සේරුවක් සිදු කර, රැස්කල ආදායම වැඩිකර ගැනීමටත් කටයුතු කරමි. | වර්ෂ 05 කට වරක් තක්සේරු කරවාගැනීමටත්, හිඟ වරිපනම් අයකරගැනීමටත් කටයුතු කළයුතු වේ. |

### 2.2.2. කඩ කුලී

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බදු කඩ කාමර 85 ක් සඳහා ගිවිසුම් අත්සන්කර නොතිබුණ අතර, 2020 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ කඩ කුලී ශේෂය රු.6,877,450 අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් අත්සන් කර නොමැති කඩ කාමර සඳහා ගිවිසුම් අත්සන් කරමි. හිඟ කඩ කුලී කොටසක් කපා හැරීමට අනුමැතියට යවා ඇත. අනුමැතිය ලද පසු එම හිඟ ඉවත් කර, ඉතිරි ශේෂය අයකිරීමට කටයුතු කරමි. | ගිවිසුම් අත්සන් කිරීමටද, හිඟ කඩ කුලී අයකරගැනීමටද, කටයුතු කළයුතු වේ. |